# Jan Van Eyke සහ පුනරුදයේ ලෞකික තේමා භාවිතය

කේ. එම්. ඩී. සුලෝචනා සෙනෙවිරත්න[1]

ග්‍රීක - රෝම සම්භාව්‍යය යුගයන් ඇසුරින් වර්ධනය වෙමින් ඉතාලිය කේන්ද්‍ර කරගනිමින් බිහි වූ පුනරුදය මානවවාදී චින්තනයෙන් කලාව පෝෂණය කරන්නට විය. මෙකල බිහි වූ කලා නිර්මාණ ආගමික තේමා, මිත්‍යා තේමා, ලෞකික තේමා පාදක කරගනිමින් නිර්මාණය විය. Jan Van Eyke යනු ආගමික තේමා සහ ලෞකික තේමා යොදාගනිමින් සිතුවම් කරණයේ නිරත වූ ප්‍රකට සිත්තරෙකි. ලෞකික තේමා කෙරෙහි ඔහු වැඩි අවධානයක් ලබා දී ඇති අතර ඒ සඳහා එවක ප්‍රභූ ධනවත් පුද්ගලයන්ගේ අනුග්‍රහය නිබඳ ව ම කලා නිර්මාණයන් සඳහා හිමි වී ඇත. Jan Van Eyke හට Giovanni Arnolfini ගේ අනුග්‍රහය යටතේ සිතුවම් නිර්මාණය කිරීමට අවකාශය උදා වූයේ ඒ අනුව ය. ලෞකික තේමා යොදාගනිමින් සිතුවම් කරණයේ නියැලුණු Jan Van Eyke බහුල වශයෙන් ප්‍රතිරූප නිර්මාණය කර ඇත. මුල් කාලීන ව ධනවතුන් විසින් තම හිතවතුන්ගේ වියෝවෙන් අනතුරු ව ගොඩනඟන සොහොන් කොත සඳහා ඒ මියගිය තැනැත්තාගේ ප්‍රතිරූපය නිර්මාණය කිරීම සිරිත් පරිදි සිදු කර ඇත. කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිරූප නිර්මාණය කිරීම ධනවත් ප්‍රභූවරුන්ගේ වත්කම පිළිබිඹු කරන්නා වූ කැඩපතක් බඳු විය. Jan Van Eyke ගේ ප්‍රතිරූප නිර්මාණ ආකෘතිය ක්‍රමික විකාශයට බඳුන් වෙමින් සරල පැති පෙනුම සහිත ආකෘතියේ සිට පූර්ණ ලෙසින් ජීවමාන ස්වරූපයෙන් ප්‍රතිරූප නිර්මාණය කිරීමට ශිල්පියා උත්සාහ දරා ඇත. උදාහරණ ලෙස 'Portrait of a Man in a Turban' සහ 'Giovanni Arnolfini and his wife' නම් වූ සිතුවම් ද්විත්වය දැක්විය හැකි ය. සරල ආකෘතික ලක්ෂණ අබිබවා යමින් සියුම් මෝස්තරාංග, රතු-කොළ-නිල් වැනි වර්ණ බහුල ව භාවිතයට ගැනීම මෙන් ම සංකේත භාවිතය Jan Van Eyke ගේ සිතුවම්හි දැකිය හැකි සුවිශේෂත්වය යි. මානව ශරීරයේ සුන්දරත්වය මිණිත ක්‍රමයන්ට අනුකූල ව පිළිබිඹු කරන්නා සේ ම එකල ජන සමාජයේ ආගමික, ආර්ථික, දේශපාලනික සහ සාමාජීය තතු සංකේත මඟින් විදහා පෑමට Jan Van Eyke උත්සහ කර ඇති බව විමර්ශනය කළ කරුණුවලින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** පුනරුදය, සිතුවම් ශෛලිය, ලෞකික තේමා, ආකෘතික ලක්ෂණ, සංකේත

---

[1]දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසගිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය